# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2299/02 – 2022 සැප්තැම්බර් මස 26 වැනි සඳුදා – 2022.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 සැප්තැම්බර් මස 11 වැනි දින අංක 1879/08 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2014 අංක 236 දරන ආඥාවේ කැබලි අක්ෂර A ලෙස සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/13/2011/CA/302.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: MRT/LND/ACQUI/L/01/3920.
2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කඩවත් සතර සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක 419ජී ඇඳුව මදුරුදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගොඩගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මාර 2620 හා 2014.12.29 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.0916ක් වන ගල්තොල්ල ආම්ස්ට්‍රොන් බංගලාවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 – ගල්තොල්ල ආම්ස්ට්‍රොන් බංගලාවත්ත – ප්‍රමාණය: හෙක්. 1.0916 ක් පමණ**

උතුරට: ලලිත් විජේසේකර සහ තවත් අය හිමිකම් කියන ඇටඹගහදෙනිය කුඹුර සහ ඇළ කණ්ඩිය; නැගෙනහිරට: ඇළ කණ්ඩිය, ලලිත් විජේසේකර හිමිකම් කියන වරද්දෙනිය කුඹුර සහ සිරියාවතී මනම්පේරි සහ තවත් අය හිමිකම් කියන වරද්දෙනිය කුඹුර; දකුණට: සිරියාවතී මනම්පේරි සහ තවත් අය හිමිකම් කියන වරද්දෙනිය කුඹුර සහ බන්දුල ඇපා හිමිකම් කියන ගල්තොල්ල; බටහිරට: බන්දුල ඇපා හිමිකම් කියන ගල්තොල්ල සහ ලලිත් විජේසේකර සහ තවත් අය හිමිකම් කියන ඇටඹගහදෙනිය කුඹුර.

EOG 09 – 0296